*ISBN 978-955-4563-72-8*

# කාර්මික පුරාවිද්‍යාවේ ආරම්භය හා විකාශය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**පූජ්‍ය. පාහියංගල සුමංගල හිමි**

**පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

**සංක්ෂේපය**

*මෑතකාලීන පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ජනප්‍රිය වෙමින් පවතින විෂය ක්ෂේත්‍රයක් ලෙස කාර්මික පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය හඳුන්වා දිය හැකි වන්නේ එහි පවතින ජීවගුණය නිසා කිවහොත් එය නිවැරදිය. යුරෝපීය රටවල සිදු වූ කාර්මික විප්ලවයත්, එය සිදු වී සියවසක් ඇවෑමෙන් භාවිතයෙන් ඉවත් කරන ලද කර්මාන්ත ශාලා, ස්මාරක වල්බිහි වන්නට විය. මෙම ස්මාරකයන් තුළ පවතින පෞරාණික ජීවගුණයන් විසිවන ශතවර්ෂයට එළඹීමත් සමගින් වැඩිවන්නට විය. පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ නව සොයාගැනීම් හා පෞරාණික ස්ථාන සංරක්ෂණය කිරීමේ නව සංවිධාන, ආයතන හා නිර්වචන සමගින් කාර්මික උරුමයන් පිළිබඳව පුරාවිද්‍යා ඇසකින් බලන්නට පුරුදුවිය. මෙය කාර්මික පුරාවිද්‍යාවේ ආරම්භය සනිටුවන් වන ප්‍රාථමික අවස්ථාවයි.*

## හැඳින්වීම

ලෝකයේ විවිධ වස්තු විෂයන් මූලික කරගෙන විවිධ විෂයන් බිහිවීම ඈත අතීතයේ පටන්ම දක්නට ලැබේ. එසේ බිහි වූ විෂය ධාරාවක් ලෙස පුරාවිද්‍යා විෂය ඉදිරියෙන් සිටියි. දැනට ශේෂ වී ඇති නටබුන් හා හෝඩුවාවලින් පැරණි මිනිස් සමාජයන්හි තොරතුරු යළි ගොඩනගා ගැනීම පුරාවිද්‍යා විෂය තුළින් සිදු වේ. මෙහි අනුවිෂයක් ලෙස කාර්මික පුරාවිද්‍යාව මෑත කාලීන කාර්මික විප්ලවීය අවශේෂයන් මූලික කරගෙන ලෝකය පුරා ව්‍යාප්ත වන්නට විය. 17 වන සියවසේ අග සහ 18 වන සියවසේ මුල් කාලීන කාර්මික පුරාවිද්‍යාවේ ආරම්භය සිදු වූ අතර, වර්තමානයේ එහි සාධනීය දියුණුවක් ලබාගෙන සිටියි. එහි ආරම්භය හා විකාශය පිළිබඳව මෙහි දි අධ්‍යයනයට ලක් කෙරේ.

## අන්තර්ගතය

කාර්මික පුරාවිද්‍යාව විෂයක් ලෙස පුරාවිද්‍යාවට සම්බන්ධ වීම ක්‍රි.ව 1950 න් පසුව සිදුවිය. මෙම විෂය විෂයක් විධියට වර්ධනය කිරීමට පුරෝගාමී වූයේ මයිකල් රික්ස් වන අතර ඔහු කාර්මික පුරාවිද්‍යාවේ පියා ලෙස සලකනු ලැබේ. කාර්මික පුරාවිද්‍යාව විෂය බිහි වීමට ප්‍රධානතම හේතුව වූයේ කාර්මික විප්ලවයයි (Industrial Revelution). සරලව කාර්මික පුරාවිද්‍යාව යන්න විමසා බලන විට ක්‍රි.ව 18-19 සියවස් වල කාර්මික විප්ලවය නිසා බිහිවුණු උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, ස්මාරක හා ඒ හා සම්බන්ධ තාක්ෂණික අංගයන් අධ්‍යයනය කිරීම යනුවෙන් නිර්වචනය කළ හැකිය. බ්‍රිටනිකා එන්සයික්ලෝපීඩියාහි කාර්මික පුරාවිද්‍යාව“The study of the buildings, machinery and equipment of the industrial Revelution” ලෙස අර්ථ දක්වා ඇත. 2003 දී යුනෙස්කෝ සංවිධාන (UNESCO) විසින් කාර්මික උරුමයන් රැක ගැනීම අරමුණු පෙරදැරි කරගෙන රුසියාවේ දි නිෂ්නි ටාජිල් ප්‍රඥප්තිය තුළින් ද කාර්මික පුරාවිද්‍යාව නිර්වචනය කර ඇත. එහි දි කාර්මික ක්‍රියාවලිය සඳහා හෝ එහි ප්‍රතිඵලයක් ලෙස ශේෂව ඇති සාක්ෂි ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන ලේඛන, පුරාවස්තු, භූ ස්ථර පිළිබඳ ස්ථරායනය මානව ජනාවාස, ස්වභාවික නාගරික භූ දර්ශනයන් යනාදියේ අන්තර් ක්ෂේත්‍රයන්හි සිදු කෙරෙන අධ්‍යයන කාල පරාසය හඳුන්වා දිය හැකිය. එය කාර්මික විප්ලවයේ ආරම්භයේ සිට මේ දක්වා කාලය ලෙසයි. එහිදි පූර්ව කාර්මික හා නූතන කාර්මික ප්‍රභවයන් ද අධ්‍යයන පථයට ඇතුලත් වේ.

මීට අමතරව තාක්ෂණික ඉතිහාසය තුළින් හෙළිදරව් වන ශිල්පීය ක්‍රමයන් හා තාක්ෂණික දැනුම කෙරෙහි අවධානය යොමු වේ. බ්‍රිටනිකා එන්සයික්ලෝපීඩියාහි හා නිෂ්නි ටාජිල් ප්‍රඥප්තියට අමතරව උගතුන් රැසක් ද කාර්මික පුරාවිද්‍යාව නිර්වචනය කර ඇත. **කෙනත් හඩ්සන්ට** අනුව නුදුරු අතීතයට අයත් කර්මාන්ත හා සන්නිවේදන ක්‍රමයන්හි ද්‍රව්‍යාත්මක අවශේෂ අධ්‍යයනයකි. **රයස් ට්‍රක්ට** අනුව අනුව මිනිසා ද්‍රව්‍යාත්මක සංස්කෘතියට ප්‍රවිෂ්ට වීම හා ඒ අනුව ඔහු ජීවත් වූ පරිසරයේ ඇති වූ වෙනස් වීම ද හැදෑරිය යුතු මානව විද්‍යාත්මක අධ්‍යයනයක් ලෙස නිර්වචනය කර ඇත. කෙසේ නමුත් ඇමෙරිකානු පුරාවිද්‍යාඥයෝ කාර්මික පුරාවිද්‍යාව නිර්වචනය කර ඇත්තේ ඇමෙරිකානු කාර්මික විප්ලවයෙන් පසුව ඇති වූ අවශේෂයන් අධ්‍යයනය කිරීම යනුවෙනි. එසේම කාර්මික පුරාවිද්‍යාවේ දි පුරාවස්තුවක් අවුරුදු 50 ක් පමණ පැරණි විය යුතු යැයි පිළිගෙන ඇති අතර

*ISBN 978-955-4563-72-8*

කාර්මික පුරාවිද්‍යාවේ කැණීම් සිදු නොකෙරේ. මතුපිට පොළවේ කාර්මික පුරාවස්තු තවමත් ගවේෂණය කොට සොයමින් පවතින බැවිණි. මෙහි දි ප්‍රධාන අදියර කීපයක් ස්ටබාක්, හඩ්සන් සහ මිල්වින්ටන් වැනි උගතුන් පෙන්වා දී ඇත.

- සොයා ගැනීම
- ලැයිස්තු ගත කිරීම
- වාර්තා ගත කිරීම
- සංරක්ෂණය

මෙහි දි කාර්මික විප්ලවයෙන් පසුව බිහිවුණු කාර්මික ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, දුම්රිය මාර්ග හා ඒ ආශ්‍රිත ස්මාරක, පැරණි මෝටර් රථ හා ප්‍රවාහන ක්‍රම, සන්නිවේදන පද්ධති සම්බන්ධ උපකරණ, පැරණි නාවික කටයුතු සම්බන්ධ උපකරණ, ගුවන් ගමන් සම්බන්ධ ස්මාරක, සිනමාවසම්බන්ධ උපකරණ සහ එහි තාක්ෂණය පිළිබඳව ද අධ්‍යයනය කෙරේ.

කා්රමික පුරාවිද්‍යාව විෂයක් ලෙස ආරම්භ වීමට ප්‍රධානතම හේතුව වූයේ කා්රමික විප්ලවයයි. යුරෝපයේ මධ්‍යතන යුගයේ දි භාණ්ඩ නිෂ්පාදනය සිදු වූයේ සුළු පරිමාණයෙන් වන අතර ඒ ගෘහස්ථ හා හස්ත කර්මාන්ත වශයෙනි. නමුත් ක්‍රි:ව 18 වන සියවසයේ අග භාගයේ මිනිසා සිය දෑතේ සවිය වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් භාණ්ඩ නිෂ්පාදනයේ ඇති කළ වෙනස කාර්මික විප්ලවය ලෙස හැදින්විය හැකිය. සිංහල විශ්ව කෝෂයේ හත්වෙනි කාණ්ඩයේ ''මිනිසුන් විසින් ජීවනෝපාය සරළ කෘෂි ස්වරූපයකින් සංකීර්ණ කාර්මික එකක් බවට පත් කළ ක්‍රියාවලිය කාර්මික විප්ලවය වේ'' යනුවෙන් සඳහන් කොට ඇත. (විජේතුංග, හරිස්චන්ද්‍ර, 1998, 09) මෙලෙස ආරම්භ වූ කා්රමික විප්ලවය අඩසියවසක් යනතුරු එංගලන්තයට සීමා වුව ද ඊළග ශතවර්ෂය තුළ යුරෝපයේ සෙසු රටවලට ද ව්‍යාප්ත විය. 18 වන සියවසේ ප්‍රංශය හා ජර්මනිය රටවල කාර්මික මධ්‍යස්ථාන බිහිවන්නට විය. ප්‍රංශයට අයත් ප්ලාන්ඩර්ස් සහ නෝමැන්ඩි ප්‍රදේශ ද, ජර්මනියේ සාක්සනිය ද ලෝම රෙදි නිපද වූ මධ්‍යස්ථාන ලෙස ප්‍රචලිත ය. කෙසේ වෙතත් 19 වන සියවසේ සෙසු රටවලට කාර්මීකරණය පැතිරීමට හේතු කිහිපයක් වේ.

- යුරෝපා මහද්වීපය තුළ ගමනාගමනය හා ප්‍රවාහන කටයුතුවල වර්ධනය
- ඕස්ට්‍රේලියානු අධිරාජ්‍යයේ සැතපුම් 30000 දුර ගමන් මාර්ග ඉදිකිරීම
- බෙල්ජියමේ මාර්ග පද්ධතිය දෙගුණයකින් පුළුල් කිරීම
- ප්‍රංශයේ මහා මාර්ග මෙන් ම ඇළ මාර්ග ද ඉදිකිරීම
- ක්‍රි:ව 1840 වන විට සෑම රටකම දුම්රිය මාර්ග ඉදිකිරීම
- ප්‍රංශයේ හා ජර්මනියේ ගල් අඟුරු සොයා ගැනීම

මෙසේ දියුණු වූ කාර්මික රටවල් අලුත් සොයාගැනීම් වල නිරත වන්නට විය.එහි ප්‍රතිඵලයක් ලෙස 1769 දී ජේම්ස් වොට් නව හුමාල එන්ජිමක් සඳහා ආරක්ෂක බල පත්‍රයක් ලබා ගත්තේ ය. තව ද ඇමෙරිකානු ජාතික එලියස් ගෝවේ විසින් 1846 දී රෙදි මැසීමේ යන්ත්‍රය සොයා ගැනීම, 1811 දී හෙන්රි බෙල් ප්‍රථම දුම් නැව නිපදවීම,1812 දි හම්පි ඩේවි විසින් ආරක්ෂක ලාම්පුව නිපදවීම සහ 1903 රයිට් සහෝදරයෝ ගුවන් යානය සොයා ගැනීම මේ අතර කැපී පෙනෙයි. වෙළෙඳ පොළ තුළ කාර්මික නිෂ්පාදන පුළුල් වීම මගින් ආ්රථික ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති විය. සමාජය තුළ කර්මාන්ත ශාලා බිහිවීම හා එමගින් ජනාකීර්ණ බවක් ඇති විය. මේ ආකාරයෙන් ඇති වූ කාර්මික විප්ලවය සම්බන්ධ උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා කාර්මික පුරාවිද්‍යාව නමින් අලුත් විෂයක් බිහි වන්නට විය.

කා්රමික පුරාවිද්‍යාව විෂයක් ලෙස වර්ධනය වන ආකාරය 1950 දශකය තුළ දක්නට ලැබේ. නමුත් 1918 දී පමණ Sheffeild නගරයේ කාර්මික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා Sheffield Trades Technical Societies නමින් සංවිධානයක් ආරම්භ කළ ද එය විෂයීය වර්ධනයට ප්‍රමාණවත් නොවීය. කා්රමික පුරාවිද්‍යාව විෂය ආරම්භ වී තවමත් අවුරුදු 60 කට ආසන්නය. මෙහි දි ප්‍රථමයෙන් ලතින් භාෂාව හා බිතුසිතුවම් පිළිබඳ මහාචාර්යවරයෙකු වන Birminghan විශ්වවිද්‍යාලයේ සේවය කල Donald Dudley මහතා විසින් 'කා්රමික' (Industrial) යන වචනය හඳුන්වා දී ඇත. කාර්මික පුරාවිද්‍යාව පිළිබඳ මූලික කතිකාවතක් ආරම්භ කළේ Birminghan විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු

*ISBN 978-955-4563-72-8*

ලෙස සේවය කල මයිකල් රික්ස් ය. ඒ 1995 දි 'ආධුනික ඉතිහාසඥයා' (Historical Ameture) යන සඟරාවට ලිපියක් පළකිරීමෙනි. එම ලිපියෙන් 18 හා 19 වන සියවස්වලට අයත් කාර්මික ස්ථාන හා උපකරණ උරුමයන් ලෙස ආරක්ෂා කිරීමටත් ඒවා අධ්‍යයනය කිරීමටත් අවශ්‍ය බව ඔහු පෙන්වා දුන්නේ ය. මොහු එංගලන්තය කාර්මික විප්ලවයේ කේන්ද්‍රස්ථානය ලෙස සලකයි.

"Great Britain, he said as the birthplace of the Industrial Revelution is full of monuments by the remarkable series of events" (Hudson. Kenneth, 1963, PG: 11)

තවදුරටත් මයිකල් රික්ස් පවසා සිටියේ කාර්මික විප්ලවයේ අවශේෂයන් අධ්‍යයනයට යම්කිසි ක්‍රමයක්, යාන්ත්‍රනයක් තිබිය යුතු බවයි. මයිකල් රික්ස්ගේ කා්රමික පුරාවිද්‍යාව යන වචනයට විවිධ විවේචන පසු කාලීනව එල්ලවන්නට විය. ඊට හේතුව පුරාවිද්‍යාව හා කාර්මික යන වචන දෙක එකට සම්බන්ධ කළ හැකි ද යන්නයි. වසර 7 ක් පමණ මෙම මතවාද පැවතුණි. කෙසේ වෙතත් මයිකල් රික්ස් සාධක ඉදිරිපත් කරමින් තම අදහස සනාථ කලේය. ඒ කාර්මික උරුමයන් රැක ගැනීම සඳහා ය. ඒ අනුව 1959 දි බ්‍රිතාන්‍ය කවුන්සිලය කමිටුවක් පත් කළේය. මෙමගින් කාර්මික උරුමයන් රැක ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන ලදි. මේ කාලය තුළ ඉතා වැදගත් සිදු වීමක් සිදුවිය. ඒ ඉතා පැරණි කාර්මික ස්මාරකයන් වන යූස්ටන් ආරුක්කුව (Easton Arch) කඩාගෙන වැටීමයි. එහි දි එය ආරක්ෂා කර ගත යුතු බවට හඬක් නැගුණි. මේ සම්බන්ධව සොයා බැලීමට බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් කමිටුවක් පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 1965 දි පමණ යූස්ටන් ආරුක්කුව පිළිබඳ ගවේෂණ වාර්තාවක් ඉදිරිපත් කෙරිණි. මේ සිදුවීම තුළින් ජනතාවගේ අවධානය කාර්මික උරුමයන් ආරක්ෂා කිරීමටත්, විෂයක් ලෙස අධ්‍යයනයටත් යොමු විය.

අනතුරුව 1965 දි කාර්මික අවශේෂයන් වාර්තාගත කොට ලේඛන ගත කිරීම බාත් විශ්වවිද්‍යාලයේ (Bath University) මහාචාර්ය Agnos Buchanan මහතා විසින් සිදුකරන ලදි. 1960 සිට කාර්මික පුරාවිද්‍යාවට සම්බන්ධ ආයතන රැසක් බිහිවීම එංගලන්තය තුළ දක්නට ලැබේ.

- Gloucestershire Society for Industrial Archaeology - 1963
- Bristol Industrial Archaeological Society - 1967
- Greater London Industrial Archaeology Society - 1968

මෙම සංවිධාන මගින් ස්ථානයක කාර්මික පුරාවස්තුවක් වාර්තාගත කිරීමේ දි ස්ථානයේ ඉතිහාසය පිළිබඳව කෙටි සාරාංශයක්, පැරණි සිතියම් ඡායාරූප, මිනුම් කටු සටහන් සහ වර්තමානයේ පෙනෙන්නට තිබෙන ඡායාරූප ඇතුලත් විය යුතු අතර, වාර්තාවේ පිටපතක් අනාගත ප්‍රයෝජනය සඳහා ලේඛනාගාර ගතකර යුතු යැයි ප්‍රතිපත්තියක් ඇතිකර ගත්හ. මීට අමතරවඑංගලන්තයේ කම්බර්ලන් වෙස්මෝලන් යන ප්‍රදේශ වල කාර්මික ස්මාරක පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කොට ඇත. මෙම වාර්තා ප්‍රකාශයට පත් වීමත් සමඟ ජනතාවගේ අවධානය කාර්මික උරුමය කෙරෙහි වැඩි විය. 1962 වේල්ස් විශ්වවිද්‍යාලයේ සම්මන්ත්‍රණයක් මගින් උතුරු වේල්ස්යේ ඉතිහාසය ලෝහ උණු කිරීම, යකඩ නිෂ්පාදනය හා ජල පොම්පාගාර ආශ්‍රිත තාක්ෂණික රටා පිළිබඳව දේශන පවත්වා ඇත. 1958-59 දි පමණ Birminghan විශ්වවිද්‍යාලයේ පළමු වරට විෂයක් ලෙස උගන්වා ඇත. මෙහි දි කථිකාචාර්යවරුන් කාර්මික විප්ලවයේ සාහිත්‍යමය අවධිය හා 18 වන සියවසේ කළ කැණීම් පිළිබඳව ඉගැන්වීම් සිදු කරන ලදි. ක්‍රමානුකූලව අධ්‍යයන කළ ප්‍රථම කාර්මික පුරාභූමිය වන්නේ Iorn Bridge නමින් හඳුන්වන යකඩ පාලමයි. මෙය එංගලන්තයේ Shropshire ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම යකඩ පාලම සංකේතවත් කරමින් පුරාවිද්‍යා කෞතුකාගාරය සැකසුණි. 1968 දි යුනෙස්කෝ (UNESCO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කරන ලදි.

බ්‍රිතාන්‍ය ජාතික ලේඛකයෙකු වූ කෙනත් හඩ්සන් විසින් 1963 දි ප්‍රථම වරට කාර්මික පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ග්‍රන්ථයක් රචනා කරන ලදි. එය "Industrial Archaeology: An Introduction" නම් වේ. 1970 දශකය කාර්මික පුරාවිද්‍යාවේ වැදගත් කාල පරිච්ඡේදයක් විය. තෝරාගත් රටවල් කිහිපයක ආධුනික හා පළපුරුදු වෘත්තිකයෝ එකතු වී විවිධාකාරයේ අරමුණු මූලික කරගෙන ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 1971 දි ඇමෙරිකාවේ වොෂින්ටන් නගරයේ දි හමුවිය. මෙමගින් Society for Industrial Archaeology (SIA) ආයතනය පිහිටුවා ගන්නා ලදි. මෙහිදි ඇමෙරිකාව Archaeology යන වචනය වෙනුවට Archeology යන වචනය භාවිතා කරන ලදි. මෙම සංගමයේ ප්‍රථම පුවත් සඟරාව 1972 දි ජනවාරි මස ප්‍රකාශයට පත් කරන ලදි. එම සඟරාව The Journal of

***ISBN 978-955-4563-72-8***

Industrial Archaeology නම් වූ අතර එහි කතෘ වූයේ ඉමෝනි එල් කෙම්ප් ය. 1980 පමණ වන විට එංගලන්තයේ මෙන්ම ඇමෙරිකාවේ ද මෙම විෂය ප්‍රචලිත විය. මෙමගින් පුරාවිද්‍යාවේ තිබෙන සිද්ධාන්ත කාර්මික ක්ෂේත්‍රයට අනුගත වීම සිදුවිය. එංගලන්ත කාර්මික පුරාවිද්‍යාඥයෝ ප්‍රධාන වශයෙන් ස්මාරකවල තාක්ෂණය පිළිබඳව අවධානය යොමු කළහ.

1990 දශකය පමණ වන විට කාර්මික උරුමයන් නැරඹීමට ජනතාව යොමු විය. මේ අවධිය වන විට කාර්මික ස්ථාන රැසක් යුනෙස්කෝව විසින් ලැයිස්තු ගත කොට සංරක්ෂණය කිරීමෙන් අනතුරුව සංචාරක කර්මාන්තය සඳහා යොදා ගන්නා ලදි. 1999 දී පමණ European Route of Industrial Heritage (ERIH) ආයතනය ස්ථාපිත කිරීමෙන් සංචාරක කර්මාන්තයට නව පිටුවහලක් ලැබුණි. මෙමගින් යුරෝපයේ රටවල් 43 ක විසිරී ඇති කාර්මික ස්ථාන 1,200 කට ආසන්න ප්‍රමාණයක් සංරක්ෂණය කොට ප්‍රදර්ශනය කිරීමට හැකිවිය. The International Committee Heritage for the Conservation of the Industrial Archaeology සංවිධානය මගින් 2003 දී නිෂ්නි ටාගිල් (Nizhny Tagil) ප්‍රඥප්තිය රුසියාවේ දී සම්මත කර ගන්නා ලදි. මෙය ඩුබ්ලින් ප්‍රතිපත්ති මාලාව ලෙස හැඳින්වේ. මේ වන විට කාර්මික පුරාවිද්‍යාව සම්බන්ධ බොහෝ රටවල ආයතන රැසක් බිහි වී ඇත. ඒ අතර

- Japan Industrial Archaeology Society – 2007
- Industrial Heritage Association of Ireland – 1996
- Association for Industrial Archaeology- Britain- 1973
- Society for Industrial Archaeology- Canada- 1971

මෙවැනි සංගම් සමුළු මගින් විෂය පරාසය විශාල වන්නට විය. ගවේෂණය පුළුල් වූ අතර එමගින් විෂය අවබෝධය වැඩි විය. 1950 දශකයේ සිට 2014 වර්ෂය තෙක් කාලය බලන විට කාර්මික පුරාවිද්‍යාව විෂයය ක්ෂේත්‍රය තුළ විශාල ප්‍රගතියක් ලබාගෙන ඇත. යථෝක්ත කරුණු අනුව පැහැදිලි වන්නේ කාර්මික පුරාවිද්‍යාව කාර්මික විප්ලවය හා ඉන්පසු එහි අවශේෂ අධ්‍යයනය කරන විෂයක් වශයෙන් වර්ධනය වූ ආකාරයයි.

## නිගමනය

පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට ආගන්තුක විෂයක් වෙමින් 1950 දශකයෙන් පසු යුරෝපය, අමෙරිකාව හා ආසියාතික රටවල සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ගිය කාර්මික පුරාවිද්‍යව විෂය, වර්තමානය වනවිට ලෝකයේ විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ රැසක් සිදු වී ඇත. විෂයීය වර්ධනයට පුරෝගාමී වූ මයිකල් රික්ස් කාර්මික උපකරණ හා ඉදිකිරීම් ආරක්ෂා කිරීම් සඳහාද දේශන හා ලිපි ලේඛන මගින් මිනිසුන් දැනුවත් කළහ. සංචාරකයන් අතර පුරාණ ස්මාරක නැරඹීමට අමතරව කාර්මික උරුම ස්ථාන නැරඹීම සඳහාද ආකර්ශනය වෙමින් පවති. කාර්මිකකරණයේ මුල් කෘති බොහොමයක් කෞතුක භාණ්ඩ ලෙස කෞතුකාගාර තුළ තැන්පත් කොට ඇත. වර්තමානනය වනවිට සංවිධාන හා අයතන රැසක් මෙම කාර්මික උරුමයන් ආරක්ෂා කරගැනීම සඳහා නිර්වචන ඉදිරිපත් කරමින් වඩසටහන් ක්‍රියාත්මක කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


ජයතිලක, ජී. ඩබ්ලිව්.(2002) යුරෝපා ඉතිහාසය 2 (නූතන යුරෝපය 1815 දක්වා) එස් ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10.

විජයතුංග, හරිස්චන්ද්.(1988) සිංහල විශ්වකෝෂය 7 වැනි කාණ්ඩය, සංස්කෘතික අමාත්‍යංශය.

හෙට්ටි ආරච්චි, ඩී. ඊ.(1978) සිංහල විශ්වකෝෂය පළමු වැනි කාණ්ඩය, සංස්කෘතික අමාත්‍යංශය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.(2004) යුරෝපා ඉතිහාසය (ක්‍රි.ව 1500 සිට 1950 දක්වා) සිසාරා ප්‍රින්ට්, පිට කෝට්ටේ

Hudson. Kenneth. (1963) Industrial Archaeology: An Introduction.UK

http://www.sia-web.org/about/history-of-sia/sia-past-presidents/

https://en.wikipedia.org/wiki/Industrial_archaeology

http://www.erih.net/welcome.html